| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම :— | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... ... | 200 | 0 |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම :— | | |
| (1) ගිනිනිවන බඳුන් ප්‍රතිපූරණය කිරීම ... | 300 | 0 |
| | 11,400 | 0 |

1973 ජූනි 25 වැනි දින රැස්වීමේ අංක 8 (1) දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ඇම්. පී. දිසානායක,
සභාපති,
දන්කොටුව සුළු නගර සභාව.

1973 ක්වූ ජූලි මස 03 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

අනුමත කරමි.

ලලිත් හෙට්ටිආරච්චි,
ප. පා. සහකාර කොමසාරිස්.
(හලාවත/පුත්තලම).

1973ක්වූ ජූලි 26 දින,
හලාවත දිය.

8-640/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

**දන්කොටුව සුළු නගර සභාව**

සුළු නගර සභා මු. රෙ. 40 (II) යටතේ අයවැම පත්‍රය—අංක 1

**1973 වර්ෂයේ (විදුලිය) අය වැය ලේඛනය**

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| (i) කොටස—ආදායම් :— | | |
| (5) නඩත් තු හා අළුත් වැඩියාවන්— | | |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 1,000 | 0 |
| (ඩී) විවිධ ගාස්තු ... ... ... | 500 | 0 |
| (ii) කොටස.—ප්‍රාග්ධනය— | | |
| (16) ඉදිකිරීම හා දීර්ඝ කිරීම ... ... | 4,000 | 0 |
| | 5,500 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| 3. පාලනය හා සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) වැටුප් හා වේතන ... ... ... | 500 | 0 |
| (අයි) සාමාන්‍ය අංශයට දයක මුදල් ... ... | 1,000 | 0 |
| (එච්) ගණන් පරීක්ෂණ ගාස්තු ... ... | 600 | 0 |
| 4. විදුලි බලය බෙදාහැරීම— | | |
| (ඒ) වැටුප් හා වේතන ... ... | 800 | 0 |
| (සී) අතිකාල දීමනා ... ... ... | 600 | 0 |
| 5. නඩත්තු හා අළුත්වැඩියාවන්— | | |
| (බී) මීටර් හා අනිකුත් උපකරණ ... ... | 2,000 | 0 |
| | 5,500 | 0 |

1973 ජූනි 25 වැනි දින රැස්වීමේ අංක 8(iii) දරණ යෝජනාවෙන් සභා සම්මතකර ගන්නා ලදි.

ඇම්. පී. දිසානායක,
සභාපති,
දන්කොටුව සුළු නගර සභාව.

1973 ක්වූ ජූලි මස 03 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

ලලිත් හෙට්ටිආරච්චි,
ප. පා. සහකාර කොමසාරිස් (හලාවත/පුත්තලම).

1973ක්වූ ජූලි 26 දින,
හලාවතදීය.

8-640/3—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

# දේපල විකිණීම්

**මහනුවර මහ නගර සභාව**

වරිපනම් බදු නොගෙවීම නිසා තහනමට ගන්නා ලද බඩුබාහිරාදිය විකිණීම

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දේපොල වෙනුවෙන් 1968 වර්ෂයේ සිට ලැබිය යුතු වරිපනම් බදු ගෙවනු නොලැබීම හේතුකොට ගෙන, 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 252 වැනි වගන්තිය ප්‍රකාර තහනමට ගන්නා ලද පහත සඳහන් බඩු බාහිරාදිය යථෝක්ත ආඥාපනතේ 256 වැනි වගන්තිය ප්‍රකාර 1973 සැප්තැම්බර් මස 7 වෙනි දින පෙ. ව. 9 ට මහනුවර මහ නගර සභා කාර්යාලීය භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවත්, ඊට ප්‍රථම යථෝක්ත වරිපනම් බදු සහ ගාස්තු නිසියාකාරව ගෙවනු නොලැබුවහොත් එදින එකී වේලාවට එම වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඇම්. ගුණරත්න බණ්ඩා,
නාගරික ගණකාධිකාරී.

1973 අගෝස්තු මස 1 වැනි දින,
මහනුවර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| ස්ථානය හා අංකය | | බඩුභාහිරාදිය පිළිබඳ විස්තර | |
|---|---|---|---|
| 117 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | ... | කෑම මේස ... | 1 |
| | | මේස පුටු ... | 6 |
| 174/4 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | ... | මේස ... | 1 |
| | | පුටු . | 3 |
| | | යකඩ තාච්චි ... | 1 |

8–629—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**වැලිගම නගර සභාව**

හිඟ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීමයි

1960 සිට 1971 වර්ෂය අවසානය දක්වා මීට යාව ඇති උපලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු අයකර ගැනීමට, තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති වූ කල්හි මහ නගර සභා ආඥාපණතේ (252 වැනි අධිකාරය) 252 ඡේදයේ ප්‍රකාර, මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ (2) ද්‍රව සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේ දී ගෙවනු නොලැබුවහොත්, එකී උප ලේඛණයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 8 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඕ. පී. ප්‍රේමදාස,
ලේකම්,
වැලිගම නගර සභාව.

1973 අගෝස්තු 2 වැනිද.
වැලිගම නගර සභා කාර්යාලයේ දීය.

**උප ලේඛනය**

අංක 3 කොට්ඨාශය

**1973 සැප්තැම්බර් 3 වෙනි සඳුද :**

ආවාස පාර.—වරිපනම් අංක 11, 37, 45/1, 45/5, 8, 10, 18, 32/1.

පළමුවන හරස් පාර.—වරිපනම් අංක 15/1, 35, 43, 18.

ගංගාරාම පාර.—වරිපනම් අංක 25/1, 25/2, 25/5, 25/24ඩී, 49/9, 49/17 69/4, 99, 42, 42/2, 46/2

හෙට්ටිවීදිය පාර.—වරිපනම් අංක 168, 210/2, 210/3, 224, 226

මාතර පාර.—වරිපනම් අංක 335, 347, 349, 355, 357, 361, 371, 377, 443/1, 454/2, 489/9, 529

**1973 සැප්තැම්බර් 4 වෙනි අඟහරුවාද :**

මාතර පාර.—වරිපනම් අංක 617/10, 625, 649, 268, 294/1, 294/5, 336/ඒ, 346, 368/2, 488, 514, 540/2, 546, 642, 444, 730/1, 411, 413, 446, 450, 450/1, 450/2, 450/3, 450/5, 450/6, 450/7, 454/10, 336/5, 454/2, 490/1, 496/1, 564/1, 600/8, 626, 454/5, 454/6, 454/8

පරණ වීදිය පාර.—වරිපනම් අංක 17/1/6, 17/2/1, 61

**1973 සැප්තැම්බර් 5 වෙනි බදාද :**

පරණ වීදිය පාර.—වරිපනම් අංක 67, 67/1, 69/3, 69/4, 58/4

පොල්වත්ත පාර.—වරිපනම් අංක 35/7, 35/15, 32, 42, 44

දුම්රිය පොළ පාර.—වරිපනම් අංක 54, 64, 70/10, 86/9, 90/5, 90/7, 90/10, 96/7, 96/8, 66/5, 96/1

මුහුදු වෙරළ පාර.—වරිපනම් අංක 23/2, 41, 43/1

වජිරඥාණ පාර.—වරිපනම් අංක 51, 14/4, 14/5, 18

අංක 4 කොට්ඨාශය

අලුත් විදිය පාර.—වරිපනම් අංක 283, 289, 297, 301, 307, 309, 325/6, 325/7, 357, 365, 371, 373

**1973 සැප්තැම්බර් 6 බ්‍රහස්පතින්ද :**

අලුත් විදිය පාර.—වරිපනම් අංක 385, 385/1, 385/3, 427, 256/2, 258, 260, 266, 268, 272, 276, 276/2, 286, 290/1, 328/3, 348, 354, 356, 370, 374, 378, 392/1, 392/2, 392/5, 392/11ඒ, 392/13, 398, 412/6, 428/4, 428/6

කනංක පාර.—වරිපනම් අංක 1/1/1, 9

කොහුණුගමුව පාර.—වරිපනම් අංක 9/15, 9/16, 9/27, 9/31, 9/32, 33/5, 39/4, 39/7, 49/15, 59/1, 109, 63සී

**1973 සැප්තැම්බර් 7 සිකුරාද :**

කොහුණුගමුව පාර : වරිපනම් අංක : 8/1, 14, 30/12, 22/2, 30/15, 60, 102/3, 104/4, 110, 124

පළල්ල පාර.—වරිපනම් අංක 20

තාකියා මාවත.—වරිපනම් අංක 6

කොට්ඨාශ අංක 5

බහදූර් මාවත.—වරිපනම් අංක 11/3, 11/5, 15, 45, 51/1, 10, 14/1, 20, 32/2, 32/3

බොරාල පාර.—වරිපනම් අංක 34, 40, 62, 76, 106, 140, 180, 182, 214/3, 214/4, 214/6, 230, 194බී, 194සී, 194ඩී

**1973 සැප්තැම්බර් 10 සඳුද :**

ගල්බොක්ක පාර.—වරිපනම් අංක 19, 73, 75, 117, 117/9, 147, 193/6, 195, 223, 247, 193/6ඒ, 193/7, 193/9ඒ, 70, 86, 118, 120ඒ, 120/1ඒ, 124/1, 134, 138, 154, 220, 220/2

ගල්බොක්ක—වැල්ලක්ක පාර.—වරිපනම් අංක 3, 3/1, 7, 27/1, 55/3, 55/5, 61/1, 69, 22, 30, 36, 70, 94/1, 94/15

ගල්මුල්ල මාවත.—වරිපනම් අංක 5/10

මොහමඩ් මාවත.—වරිපනම් අංක 21, 57, 36/1

දෙල්සන් තෝට්ම මාවත.—වරිපනම් අංක 2

වජිරඥාණ මාවත.—වරිපනම් අංක 91, 99, 115, 78/1ඒ, 80, 84/2, 96/2, 116, 96/6.

8–623—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**බෙන්තොට සුළු නගර සභාව**

ජලභීතිකා රෝගය

බෙන්තොට සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක ගමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබනු දේ දාවූ හෝ දක්කානා නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියක්) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබනු අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ II වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයේ පළවෙන දින සිට මාස හයක් බල පවත්වනවා ඇත.

**චන්ද්‍රරත්න කොලොන්නෙ,**
**සභාපති,**
බෙන්තොට සුළු නගර සභාව.

1973 ජූලි මස 30 වැනි දින,
බෙන්තොට සුළු නගර සභා කාර්යාලය.

8–612—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**දෙඩන්ගොඩ ගම්සභාව**

ගම්සභා ආඥාපනත---257 වැනි පරිච්ඡේදය

කළුතර දිස්ත්‍රික්කයේ දෙඩන්ගොඩ ගම්සභාව විසින් 1973 ජූලි මස 30 වැනි දින පැවැත්වූ මාසික සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සහා සම්මත කරගන්නා ලද මෙහි පහත සඳහන් යෝජනාව මහජනයාගෙ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසි මහජනතාව විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් 2 කින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මෙකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් ඉන් පසු එම පාරවල් ගම්සභාව සතු දේපලක් හැටියට සලකා පාලනය කරනු ලබන බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

කේ. කේ. හෙන්රි රිචර්ඩ් ද අල්විස්,
දෙඩන්ගොඩ ගම්සභාවේ සභාපති.

**1973.8.3 වැනි දින,**
දෙඩන්ගොඩ,
ගම්සභා කාර්යාලයේදී ය.

**යෝජනාව**

1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් (I) වැනි උප වගන්තිය යටතේ දෙඩන්ගොඩ ගම්සභාව විසින් 1970 අගෝස්තු 28 වැනි දින අංක 14,921 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (IV වැනි කොටස) පළකරන ලද යෝජනාවකින් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාදහෝ නැවත සාද පවත්වා ගෙන යා යුතු යයි දෙඩන්ගොඩ ගම්සභාවේ සභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ඩී. ඇන්. මුණසිංහ මහතාගේ ස්ථිරත්වයෙන් පිළිගැනි ඒකච්ඡන්දයෙන් සහා සම්මත විය.

**අංක 3 දෙඩන්ගොඩ බටහිර ගම්සභා ඡන්ද කොට්ඨාශය**

| අංකය | පාරේ නම | පාර විහිදියන ආකාරය | දිග | | පළල |
|---|---|---|---|---|---|
| | | පාරේ වම්පැත්තට හා දකුණු පැත්තට මායිම් වන ඉඩම් | ප. | ද. | අඩි |
| 1 | ඉද/බ. මහගොඩ පාර | කළුතර-මතුගම ප්‍රසිද්ධ පාරේ අංක 4/6 දරන පාළම අසල මිරිස්වත්ත මහා විද්‍යාලය ඉදිරියෙන් පටන්ගෙන අරලියගහවත්ත, උඩවත්ත, නාගහවත්ත, ජාසිංහ වත්ත නොහොත් මීල්ලගහවත්ත, දෙල්ගොඩලන්ද මායිම දක්වා. | 1 | 2 | 15 |

**අංක 4 දෙඩන්ගොඩ නැගෙනහිර ගම්සභා ඡන්ද කොට්ඨාශය**

| අංකය | පාරේ නම | පාර විහිදී යන ආකාරය | දිග සැ. ප. ද. | පළල අඩි |
|---|---|---|---|---|
| | | පාරේ වම්පැත්තට හා දකුණු පැත්තට මායිම් වන ඉඩම් | | |
| 1 | ජාවිගොඩ-පොතුවිල කුඹුර පාර | ජාවිගොඩ-වැවලගොඩ ගම්සභා පාරේ ගොඩැල්ලවත්තෙන් පටන්ගෙන අංක 1216 පිඹුරේ දකුණු පැත්තට එම ඉඩමේ කැබලි අංක 15, 8, 7 (කොටසක් සහ) අංක 6 ද වම් පැත්තට එම ඉඩමේ කැබලි අංක 7, 5, 4, 3, 2, 1 ද පොතුවිල් යාය කුඹුර දක්වා. | 0 0 8 | 6 |

8-614—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට බටුවත්ත ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973.7.28 වැනි දින රැස්වීමේ දී සභා සම්මත වූ බව මෙයින් දන්වමි.

පී. ඊ. වීරරත්න,
බටුවත්ත ගම්සභාවේ සභාපති.

1973 අගෝස්තු මස 2 වැනි දින,
බටුවත්ත ගම්සභා කාර්යාලයේ දීය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පලකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"(1) මෙම අතුරු ව්‍යවස්ථාවල" අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ II වැනි හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

**උපලේඛනය**

I කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරලු හෝ කලුගල් කැනීම.

කබුක්, බොරලු හෝ කලුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය කිරීම.

ග්‍රොස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එලවලු තෙල් නිෂ්කර්ශනය.

ගැලොම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩාකර තැබීම.

පොල්තෙල් හැර වෙනත් එලවලු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගිනිපෙට්ටි නිෂ්පාදනය.

ග්‍රොස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩාකර තබා ගැනීම.

ඉඹුල් පුලුන් හෝ කපු හෝ කපු පුලුන් ගබඩාකර තබා ගැනීම.

මැතිලේටඩ් ඉස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබාගැනීම.

ගඩොල් හෝ උලු ගබඩාකර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පිදුරු ගබඩාකර තබා ගැනීම.

පාවිච්චි කල ඇඳුම් ගබඩාකර තබා ගැනීම.

කුලියට දීම් සඳහා ලාම්පු ගබඩාකර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5 වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.

අතින් ලී ඉරන ඉරුම්වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.

දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වාගෙන යාම.

ගිරි ගල් හෝ හුණු ගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මලක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්මලක් පවත්වාගෙන යාම.

තොග වශයෙන් විකිණීම් සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.

ගිස් බෝතල් හෝ ගිස් ශෝනි ගබඩාකර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යාම.

අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පොල්කටු ගබඩාකර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙනයාම.

II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙනයාම.

හම් ගබඩාකර තබා ගැනීම.

උම්මලකඩ ගබඩාකර තබාගැනීම.

කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙනයාම.

බැටලුවන්, එළුවන් හෝ ඌරන් 10 ට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙනයාම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙනයාම.

පුවක් සකස්කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

කරවල, ලුනු මාලු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම් කොල සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙනයාම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මයියොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇට කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වගී සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දූව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙනයාම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙනයාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

හුණු ගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබා ගැනීම.

ලෑලි සකස්කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

පලතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුලුබඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂබෝග කෙටීම.

බේකින් පව්ඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ ද්‍රව්‍ය නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලිකඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තැබීම.

සීත කළ මාලු හෝ මස් හෝ ගබඩාකර තැබීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙනයාම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු සුදු (වයිටින්) හුණු හෝ හිරියල් නිපදවීම.

එන්සාල්, (කරදමුංගු) සකස් කිරීම හෝ වියලීම.

III වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වගී සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

මෝරවරල් සකස් කිරීම හෝ ගබඩාකර තබාගැනීම.

බැටරි චාජ්කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙනයාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙනයාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩුකිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙනයාම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙනයාම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙනයාම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙනයාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තැබීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කවා (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටුකම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ ටීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමනය යන්ත්‍ර, සීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු රෙදි වගී නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිශ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙනයාම.

8–760—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර, 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට පහලගම්හය ගම් සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 1973. 7. 31 වෙනි දින පැවති මාසික රැස්වීමේ අංක 1 දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගත් බැව් මින් ප්‍රකාශ කරමි.

ප්‍රේමරාජ් කුමාරසිංහ,<br>
සභාපති,<br>
පහලගම්හය ගම්සභාව.

පහලගම්හය ගම්සභා කාර්යාලය,<br>
ගබ්රුගල, 1973 අගෝස්තු 1 දින.

### අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක" හෝ "අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛන යෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ". **තවද,**

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛන අන්තර්ගත කිරීමෙන් :

### උපලේඛනය

#### I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැණීම

කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම

සිසිල් බීම නිශ්පාදනය

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිශ්කර්ෂනය

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.

පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කරතබාගැනීම.

ගිනිපෙට්ටි නිෂ්පාදනය

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිණිපෙට්ටි ගබඩා කර තබා ගැනීම

ඉටිපුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම

මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම

කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

පිදුරු ගබඩා කර තබා ගැනීම

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම

කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

ස්වර්ණාභරණ නිශ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යෑම

අතින් ලී ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වා ගෙන යෑම

දැව ගබඩාවක් පවත්වා ගෙන යෑම

දර ගබඩාවක් පවත්වාගෙන යෑම

ගිරිගල් හෝ හුණුගල් සඳහා ගෑරීම

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වා ගෙන යෑම

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වා ගෙන යෑම

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම

බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වා ගෙන යෑම

අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

පොල් කටු ගබඩා කර තබා ගැනීම

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම

සිල්ක් සහ කෘතිම රෙදි වියීම හා විසිතුරු කිරීම

මැසූ ඇඳුම් නිශ්පාදනය

මුද්‍රණාලයක් පවත්වා ගෙන යෑම

#### II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම

හම් ගබඩා කර තබා ගැනීම

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම

කුකුලන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම

බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම

පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

තොග වශයෙන් විකිණීම සඳහා නරක්විනසුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම

කරවල, ලුණු මාලු හෝ ජාඩි හොණ්ඩර 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම

මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම

අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම

සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම

හුණු නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම

සත්වාහාර හෝ කුකුල් කෑම නිශ්පාදනය කිරීම

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම

සබන් නිෂ්පාදනය කිරීම

සව් හෝ මඤ්ඤොක්කා ලැටි (ටැපියෝකා) නිපදවීම

ඇටසැට්ටි ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම

ට්‍රන්ක් පෙට්ටි සෑදීම

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම

ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම

මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යෑම

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම

සිරප් හෝ පලතුරු බිම වර්ග සෑදීම

රස කැවිලි වර්ග නිපදවීම

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම

මේද නිපදවීම හෝ නිෂ්පාදනය කිරීම

දත් බුරුසු හැර වෙනත් බුරුසු නිපදවීම
දත් බුරුසු නිපදවීම

රූ එකතුකරණ ස්ථානයක් පවත්වාගෙන යෑම

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම

හුණු ගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම

ජෑඩි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම

පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබා ගැනීම

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම

සෝඩා නිපදවීම

කෙඳි සායම් කිරීම

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම

පලතුරු මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම

කෝපි ධාන්‍ය වර්ග මාෂබෝග කුළු බඩු හෝ පිටි ඇසිරීම

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය මාෂබෝග කෙටීම

බේකින් පවුඩර් නිපදවීම

පොටි නිපදවීම

මාජරින් නිපදවීම

ගෑස් මැන්ටල් නිපදවීම

ඉටි පන්දම් නිපදවීම

කපුරු නිපදවීම

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම

රෙදි සෝදන නිල් නිපදවීම

සායම් කුඩු නිපදවීම

ලාකඩ නිපදවීම

සුවඳ පුයර නිපදවීම

පාසල් රටහුණු නිපදවීම

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම

වැලි කඩදාසි නිපදවීම

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම

පාසැල් ගල්ලෑලි නිපදවීම

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම

සෙල්ලම් බඩු නිපදවීම

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම

සීත කල මස් හෝ මාලු ගබඩා කර තබා ගැනීම

කපාපු පොල් නිපදවීම

ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම

මැණික් ගල් කැපීම හෝ ඔප දැමීම

දිය හුණු සුදු (වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම

3 වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් සුද්ධ කිරීම

**රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම**

**ඩ්‍රයි ක්ලීනින් කරණ හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම**

F 2

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම

තෙල් හෝ සත්ව මේද පෑසවීම

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කෑඩීම

ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනී_

හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම

බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම

වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම

මෝටර් වාහන සර්විස් කිරීම අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම

වාත්තු මඩුවක් පවත්වා ගෙන යෑම

බෙලෙක් වැඩ පලක් පවත්වා ගෙන යෑම

ගල් ස්මාරක නිපදවීම

පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම

පැට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වා ගෙන යෑම

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම

පොලිස් හෝ ඉටි වර්ග නිපදවීම

කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම

මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම

වීදුරු භාණ්ඩ නිපදවීම

වීදුරු කැඩපත් නිපදවීම

මැටි බඳුන් ඔපදැමීම

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම

පාස්සන ඊයම් නිපදවීම

ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම

කටු කම්බි නිපදවීම

කම්බි ඇණ නිපදවීම

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම

බෙලෙක් බඳුන්, වානේ පිප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම

ජී. අයි. බාල්දි නිපදවීම

වායු සමන යන්ත්‍ර ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම

යන්ත්‍රෝපකරණ නිපදවීම

විදුලි භාණ්ඩ නිපදවීම

රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම

සංචායක බැටරි නිපදවීම

වියලි කෝෂ බැටරි නිපදවීම

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම

රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම

රේඩියේටර් නිපදවීම

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරණ වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යෑම

**සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.**

**8-617—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය**

**බෙම්මුල්ල ගම් සභාව**

**මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණත**

මෙහි පහත සඳහන් උපලේඛණයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1973 වර්ෂය තුල මස් කඩයක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් අයදුම්කර ඇති බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම් සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචි ඕනෑම අයෙකු හෝ සංවිධානයක විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිත ලිපියකින් පිටපත් 2ක් සිටිනසේ සකස් කොට මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 30ක් ඇතුලත මා වෙත එවීමට අවසර ඇති බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උප ලේඛණය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| කේ. ඇම්. රම්සිදු, අංක 32, ජයන්තා පාර, ගම්පහ ... | හරක් මස් වෙළඳාම ... | එළුවාපිටිය, මිරිස්වැල්ලලන්ද වත්තේ අංක 22 දරණ ස්ථානය |

ග. දයානන්ද ද සිල්වා,
පරිපාලන නිලධාරි,
බෙම්මුල්ල ගම් සභාව.

1973.7.13 වෙනි දින,
බෙම්මුල්ල ගම් සභා කාර්යාලය,
වටද්දර, වේයන්ගොඩ.

8–643—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ඕතර පළාත දකුණ ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය**

**ගෝඝාතක ආඥාපණත**

මෙහි පහත උපලේඛණයේ දක්වෙන අය විසින් 1973 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන ඕතර පළාත දකුණ ගම්සභාව සීමාවතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥා පණතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උප ලේඛණය**

| ඉල්ලුම්කරු | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| අන්දරේගේ දෙන් ඇලෝසියස් අප්පුහාමි ... | හරක් මස්, එළුමස්, ඌරු මස් ... | මෝරුක්කුලිය (ඕතර තඹරවිල) තෝප්පුව-දන්කොටුව පාරේ උණ පඳුර වත්තේ පිහිටි මස් කඩය |

ඩී. ජයසේකර,
සභාපති තැන,
ඕතර පළාත දකුණ ගම්සභාව.

ඕතර පළාත දකුණ ගම්සභා කායර්ාලය,
දුම්මලකොටුව, දන්කොටුව,
1973 ජූනි මස 8 වැනි දින.

8–654—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත**

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, ජාතික රාජ්‍ය සභාවේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1972 ජූනි මස 29 වැනි දින අංක 66 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XLII වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට වලංගු වන පරිදි සම්මත කර ගැනීමට ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් ප්‍රාදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඩබ්ලිව්. කේ. ඒ. ඩී. පී. අබේසිංහ,
බලයලත් නිලධාරී,
උඩුගම ගම්සභාව.

1973 අගෝස්තු මස 2 වැනි දින,
ගා/උඩුගම,
උඩුගම ගම්සභා කාර්යාලයයේදී ය.

8–751—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ඉත්තපාන ගම්සභාව**

**ජලභීතිකා රෝගය**

කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තපාන ගම්සභා ප්‍රදේශ සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම ගම්සභා ප්‍රදේශ සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලෙකු හෝ බැල්ලියක) මවිසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවලෙහිම විනාශ කරනු ලබන බව (476 වැනි අධිකාරය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පලවන දින සිට මාස 6 ක් වලංගු වන්නේ ය.

මෙයට,

කේ. ඩී. පී. තිලකරත්න,
ඉත්තපාන ගම්සභාවේ සභාපති.

ඉත්තපාන ගම්සභා කාර්යාලය,
ඉත්තපාන,
1973 අගෝස්තු මස 4 දින.

8–750—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## කුමාර පල්ලම් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1973 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පුත්තලම් දිස්ත්‍රික්කයේ, කුමාර පල්ලම් පත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක්, විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වෙනි පරිච්ඡේදය) අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම් කරුගේ නම | ස්ථානය |
|---|---|
| ඒ. ඇම්. මජීදු, පහල රතබිලාඹය, ආඩිගම. | ඔව්වුකුලම, ආඩිගම පිහිටි, සන්දිය නමැති ඉඩමේ. |

පී. ඇම්. පුන්සිරි,
සභාපති,
කුමාර පල්ලම් පත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
පු/පල්ලම, හලාවත,
1973 අගෝස්තු මස 6 දින.

8–785—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත) (261 වැනි අධිකාරය)

### කටාන ගම්සභාව

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභාව විසින් සම්මත කරගෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වෙනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රි මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වාවූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළුව) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් සම්පාදනය කරනු ලැබ, වර්ෂ 1972 ක්වූ නොවැම්බර් මස 3 වෙනි දින අංක 32 දරණ ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවල 42 වෙනි කාණ්ඩයද, මෙම යෝජනාව ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට කටාන ගම්සභා සීමාව තුළ ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභාව විසින් ප්‍රාදේශික බල මණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනා කර සිටිනු ලැබේ.

බී. ජේ. ප්‍රනාන්දු පුල්ලේ,
කටාන ගම්සභාවේ සභාපති.

1973.08.07 වන දින,
කටාන ගම්සභා කාර්යාලය,
කටාන.

8-843/1—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණත) (261 වන අධිකාරය)

### කටාන ගම් සභාව

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව විසින් සම්මත කරගෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

(261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පණතේ) 2 වැනි සහ 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පිළියෙල කරන ලදුව එම පණතේ 2 වැනි වගන්තිය ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු මස 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ප්‍රකාශයට පත් කරණ ලද අතුරු ව්‍යවස්ථා මෙම යෝජනාව ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභා ප්‍රදේශය තුල ක්‍රියාත්මක අන්දමින් පිළිගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව විසින් ප්‍රාදේශිය බල මණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥා පණතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනා කර සිටිනු ලැබේ.

බී. ජේ. ප්‍රනාන්දු පුල්ලේ,
කටාන ගම් සභාවේ සභාපති.

1973. 08. 07 වෙනි දින,
කටාන ගම් සභා කාර්යාලයේ දී ය.

8-843/2—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී, සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.